**මොරවැව ප්‍රාදේශීය සභාව**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 22 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 05 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 05 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන සංරචකයන් වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් , මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මොරවැව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය **කරනු ලැබේ.**

(අ) සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන උතුරු නැගෙනහිර පළාත් සේවා ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ (NELSIP) සමාලෝචිත වර්ෂය අවසානයේ වූ රු. 9,879,611 ක බැංකු ශේෂය සහ රු. 2,421,104 ක කෙරීගෙන යන වැඩ වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ බැංකු ශේෂය රු.2,939,078 ක් වුවද , එය රු. 2,347,014 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් බැංකු ශේෂය රු. 592,064 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සේවක ණය ලේඛණය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂය රු. 1,397,082 ක් වූවද , එය රු. 1,203,392 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් සේවක ණය ශේෂය රු. 193,687 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 5 කට අදාලව රු.27,799,475 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 512,284 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,828,062 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | **රු.000** | **රු.000** | **රු.000** |
| (i) | වරිපනම් හා බදු | 89 | 42 | 112 |
| (ii) | බදු කුලී | 580 | 747 | 513 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 136 | 40 | 178 |
| (iv) | වෙනත් ආදායම් | 2,673 | 2,924 | - |

### 2.2.2 උසාවි දඩ

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට සහ අයකර ගැනීමට විගණිත දිනය වූ 2014 මැයි 07 දින වන විටද කටයුතු කර නොතිබුණි.

## 2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2013 ජනවාරි 10 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් අනුව අළුත්වැඩියා කල යුතු භාණ්ඩ වර්ග 14 ක්, වෙන්දේසි කල යුතු භාණ්ඩ වර්ග 10 ක් සහ ඉවත්කල යුතු භාණ්ඩ වර්ග 09 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය අනුව සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සිදු කර නොතිබුණි.

## 2.4 වාහන පරිපාලනය

(අ) අනතුරකින් දැඩිලෙස අලාභහානි වී ඉවත් කර තිබූ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත අයිතිව තිබූ කැබ් රථයක් රු.මිලියන 1.8 ක විශාල මුදලක් වියදම් කර සභාව විසින් 2012 මැයි 24 දින අළුත්වැඩියාකර භාවිතා කරනු ලැබුවද එය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

වෙනත් වැය ශීර්ෂ 17 කින් රු. 1,068,000 ක් ඉහත වාහනය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වෙන්කර තිබීමෙන් එම වැය ශීර්ෂවලින් අපේක්ෂා කල ගොඩනැගිලි අළුත්වැඩියා, ජලය, සෞඛ්‍ය සුරැකුම්, පලාත් පාළන සමුළු හා ප්‍රදර්ශන සහ ප්‍රාග්ධන වියදම් අරමුණු ඉටුකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) විගණන දිනය වූ 2014 මැයි 07 දින වන විට ද සභාවට අයත් කැබ් රථයක් සුළු අළුත්වැඩියා කටයුතු නොකිරීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර මාස 08 කට වැඩි කාලයක සිට වාහන අංගනයේ ගාල්කර තිබුණි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

### 2.5.1 පුස්තකාලයක් ඉදිකිරීම

දැයට කිරුළ ව්‍යාපෘතිය මගින් නව පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. 7,048,316 ( **එකතු කළ අගය මත බදු රහිත** ) වටිනාකමට මාස තුනක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2013 ජනවාරි 22 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය **කරනු ලැබේ.**

(අ) කොන්ත්‍රාත්කරු 2013 පෙබරවාරි මස 12 දින රු. 2,421,104 ක කළ වැඩ වටිනාකමකට ඉදිරිපත් කරන ලද **බිල්පත** සඳහා මාස 14 ක ප්‍රමාද කාලයකින් පසුව ගෙවීම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අවුරුදු එකක පමණ කාලයක සිට කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් අත්හැර දමා තිබුණි.

(ආ) රු. 352,420 ක් වටිනා කාර්යය සාධන බැඳුම්කරය 2013 අප්‍රේල් 23 දින අවසන් වී ඇති නමුත් එය දීර්ඝ කරවා ගැනීමට අවශ්‍යය කටයුතු කර නොතිබුණි.

## 2.5.2 **ඇතාබැඳිවැව ප්‍රධාන මාර්ග ඉදිකිරීම**

(අ) මෙම මාර්ගයේ පළමු අදියර කි.මී. 2ක් ගල් අතුරා තාර දමා ඉදිකිරීම සඳහා රු. 12,946,957 **( එකතු කළ අගය මත බදු රහිත )** ක වටිනාකමකට මාස තුනක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 ජනවාරි 30 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) මෙම මාර්ගයේ ඉදිකිරීම් කාර්යය සාධනය සතුටුදායක මට්ටමක නොතිබීම හේතුවෙන් 2012 නොවැම්බර් 09 දින කොන්ත්‍රාත්තුව නවතා දමා 2014 මාර්තු 30 දින රු. 18,826,970 **( එකතු කළ අගය මත බදු රහිත )** ක කොන්ත්‍රාත් වටිනාකමකට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කොන්ත්‍රාත්කරුවන් ඇගයීම් කර වඩා සුදුස කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම මත රු.5,880,013 ක් අතිරේකව ගෙවීමටත් , නියමිත කාලය තුල ඉදිකිරීම් සම්පූර්ණ **කර නොතිබීමටත් හේතු වී තිබුණි.**

(ii) ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි 60.1 අනුව කොන්ත්‍රාත්තුව නවතා දැමීමෙන් පසු කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගත යුතු හෝ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම දැක්වෙන ඉංජිනේරු සහතිකයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) සභාව විසින් කොන්ත්‍රාත්කරු අසාදු කිරීමට තීරණය කර තිබුණ ද, එය ඉදිකිරීම් හා අභ්‍යාස සංවර්ධන ආයතනයට (ICTAD) දන්වා යැවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මෙම මාර්ගයේ දෙවන අදියර කි.මී. 2 ගල් අතුරා තාර දමා ඉදිකිරීම සඳහා රු. 18,046,600 (**එකතු කළ අගය මත බදු රහිත**) ක කොන්ත්‍රාත් වටිනාකමකට මාස 05 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 මැයි 31 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) මෙම මාර්ගයේ ඉදිකිරීම් කාර්යය සාධනය සතුටුදායක මට්ටමක නොතබීම හේතුවෙන් 2012 ඔක්තෝබර් මස 08 දින කොන්ත්‍රාත්තුව නවතා දමා 2014 මාර්තු 13 දින රු. 19,557,095 (වැට් රහිත) ක කොන්ත්‍රාත් වටිනාකමකට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කොන්ත්‍රාත්කරුවන් ඇගයීම් කර වඩා සුදුසු කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම මත රු.1,510,495 ක් අතිරේකව ගෙවීමටත් , නියමිත කාලය තුල ඉදිකිරීම් සම්පූර්ණ **කර නොතිබීමටත් හේතු වී තිබුණි.**

(ii) කොන්ත්‍රාත්තුව නවතා දමන විට කොන්ත්‍රාත්කරුට රු. 2,954,923 ක් ගෙවා තිබූ අතර , ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි 60.1 අනුව කොන්ත්‍රාත්තුව නවතා දැමීමෙන් පසු කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු හෝ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම දැක්වෙන ඉංජිනේරු සහතිකයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) රු. 902,330 ක් වටිනා කාර්යය සාධන බැදුම්කරයේ කාලය අවසන් වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම මුදල සභාවට අහිමි වී තිබුණි.

(iv) සභාව විසින් කොන්ත්‍රාත්කරු අසාදු කිරීමට තරණය කර තිබුණ ද, එය ඉදිකිරීම් හා අභ්‍යාස සංවර්ධන ආයතනයට (ICTAD) දන්වා යැවීමට කටයුතු කර නොතිබුණි.

2.6 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | 01 | - |
| ද්විතික මට්ටම | 09 | 04 | 05 |
| තෘතීය මට්ටම | 08 | 08 | - |
| **එකතුව** | 18 | 13 | 05 |

කළමනාකරණ සහකාර තනතුරු දෙකක් සහ සංවර්ධන සහකාර තනතුරු තුනක් පුරප්පාඩුව පැවතුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය